ශීර්ෂය **328** - මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
------------------------------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන

--------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවු කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වාදෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමේදී අත්තිකාරම් 'බී' ගිණුමට අදාල භාණ්ඩාගාර සටහන්වල හර හා බැර සැලකිල්ලට නොගැනීම නිසා වර්ෂයේ හර රු.963,361 ක් වැඩියෙන්ද වර්ෂයේ බැර රු.699,637 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.අ | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සැකසීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | අත්තිකාරම් බී ගිණුම යටතේ වන ජ'නල් සටහන් මගින් සිදුකරන ලද හර හා බැර සටහන් සැලකිල්ලට නොගැනීම මෙයට හේතුවී ඇත.ඉදිරියේදී නිවැරදිව ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම් රු.258,082 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | එකී වෙනසට හේතුව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ අග්‍රිම ශේෂය ලෙස රු.258,082 පහතින් දක්වා ඇත. එසේම අග්‍රිම ගිණුමේ වසර අවසානයේ නොපියවන උප අග්‍රිම ශේෂයක් ලෙස රු.258,082 ක් පෙන්වා දී ඇත. |
| (ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීම්වල රු.**3,697,332** ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස්කම් සඳහා සාක්ෂි විගණනයට අනාවරණය නොවුනි. | දෙපාර්තමේන්තුව සතු වත්කම් නිවැරදිව වාර්තා කිරීමට හා ඒ පිළිබඳ අදාල වන ලිපිලේඛන ක්‍රමවත්ව පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි මූලධන වත්කම් අත්පත් කර ගැනීම් (11) හා වෙනත් මූලධන වියදම් (15) යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සිදුකර ගනු ලැබේ. |
| (ඇ) ACA 6 ආකෘතිය අනුව දේපල, පිරියත හා උපකරණවල ආරම්භක ශේෂය රු.73,938,806 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ඉකුත් | අදාල චක්‍රලේඛ උපදෙස් පරිදි මූල්‍ය තත්ව ප්‍රකාශය සකස් කල යුතු වීම. | එම වෙනසට හේතුව ආරම්භක ශේෂ (Opening Balance) යටතේ පෙර වර්ෂවල මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම් වටිනාකම් |

| | | |
|---|---|---|
| වර්ෂය අවසානයේ එම වටිනාකම රු.70,978,466 ක් වූයෙන් එම ප්‍රකාශ දෙක අනුව දේපල හා පිරියත උපකරණවල ආරම්භක ශේෂයේ රු.2,960,340 ක වෙනසක් නිරීක්ෂණය විය. | | තවදුරටත් CIGAS වැඩසටහනට ඇතුලත් කරමින් පවතින බැවිනි. වසර අවසන් වන විට ආරම්භක ශේෂ ඇතුලත් කිරීම් අවසන් කර ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී වෙනත් ශීර්ෂ මගින් දරන ලද පුද්ගලික පඩිනඩි හා වෙනත් මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් ඇතුලත් කිරීම නිසා පිළිවෙළින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.18,652,183 කින් සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.9,450,644 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛවල උපදෙස් ලබාදී ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | චක්‍රලේඛය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අදාළ ACA ආකෘතිවල තොරතුරු සැලකිල්ලට ලෙන කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) දෙපාර්තමේන්තු විසින් අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කිරීමේදී දෙපාර්තමේන්තු ගිණුම්වලට කරන ලද හර සටහන් හා බැර සටහන් ද ඇතුළත් කර වසර අවසානයේ භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂය නිරූපණය වන ලෙස සකස් කර තිබුණි. මේ අනුව විගණනයට ඉදිරිපත් කර තිබූ අක්මුදල් ගැලපුම් ගිණුම චක්‍රලේඛය ප්‍රකාරව ද පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛවල උපදෙස් ලබාදී ඇති පරිදි මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිවැරදි ලෙස පිළියෙල කිරීමට සටහන් කර ගතිමි. |

**1.6.4 ගණකාධිකාරී නිලධාරියා විසින් සිදුකල යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණකාධිකාරී නිලධාරී හා ගණකාධිකාරී නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | පිළිගනිමි. 2019 වර්ෂයේ සිට මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කලද එහි පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරියේදී නිසි පරිදි කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණකාධිකාරී නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) සහ (ආ) වගන්ති | ලිපිද්‍රව්‍ය, වාර සඟරා සහ ප්‍රකාශන වැනි විශේෂ වර්ගවල භාණ්ඩ හා සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගත යුතු වුවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක්වන ප්‍රකාශන නිකුත් කිරීම සඳහා එසේ සැපයුම්කරුවන් | නිතර නිතර මිලට ගන්නා භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීම තුලින් ප්‍රසම්පාදන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4(අ) ඡේදය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත සඟරා මුද්‍රණය කරවා ඇත |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි කරගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශන නිකුත් කිරීම සඳහා රු.3,269,150 ක් වැයකර තිබුණි. | ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු කරගත යුතුය. | |
| (ආ) 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි 5.2.3 ඡේදය | ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ රු.2,885,200 ක් වටිනා උපකරණවල හිමිකම දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණද චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන පරිදි ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | මෙම උපකරණවල වටිනාකම CIGAS වැඩසටහනට 2019 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙනුවෙන් විසර්ජන පනත මගින් වර්ෂය සඳහා ලබා දී තිබූ මූලධන ප්‍රතිපාදනය රු.35,000,000 ක් වූ අතර එයින් රු. 9,566,117 ක් එනම් සියයට 27 ක් ඉතිරිව පැවතුණි. අයවැය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කල චක්‍රලේඛවලට අනුව ඉතිරි කිරීම මේ සඳහා හේතුව බව දක්වා තිබුණද වැය විෂයන් 6 ක ඉතිරිවීම් රු.7,435,441 ක් වූ අතර එය සියයට 40 සිට සියයට 93 දක්වා වූ පරාසයක විය. එම ඉතිරිවීම් සඳහා හේතු දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කල චක්‍රලේඛයට අනුව සෑම මූලධන වැය විෂයක්ම 25% ප්‍රතිපාදන ඉතිරි කල යුතු බැවින් එම අවස්ථාව වන විට ඉතිරි වී පැවති ප්‍රතිපාදන ප්‍රමාණ අනුව ඉතිරිවීම් සිදු කරන ලදී. එම හේතුව පොදුවේ මූලධන වියදම් ඉතිරිවීම්වලට දක්වා ඇත. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව සියලුම අතුරු අග්‍රිම අදාල වර්ෂයේ දෙසැම්බර් 31 | මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ සහ භාණ්ඩාගාර අයවැය චක්‍රලේඛවල දක්වා | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය ලෙස රු.258,082 ක් තබා ගැනීමට |

| | | |
|---|---|---|
| දිනට පියවිය යුතු වුවද 2019 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද අග්‍රිම ශේෂය රු.258,083 ක් විය. | ඇති උපදෙස් හා මඟපෙන්වීම් ප්‍රකාරව අග්‍රිම පියවීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | සිදුවූයේ 2019 ජනපතිවරණ රාජකාරි වෙනුවෙන් නිලධාරීන් වෙත මුදල් ලබාදෙන ලද්දේ අත්තිකාරම් ගෙවීම් වශයෙනි. එයට අදාල මුදල් මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පසු නැවත 2020 පෙබරවාරි මස භාණ්ඩාගාරය වෙත ලබාදීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල රැකියා අපේක්ෂකයින් 25,864 දෙනෙකු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ අතර ලියාපදිංචි කල රැකියා ඇබෑර්තු සංඛ්‍යාව 23,266 කි. කෙසේ වුවද රැකියා අපේක්ෂිතයින්ගෙන් 3,392 ක් පමණක් රැකියාගත කර තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේදී අපේක්ෂිතයින් රැකියා ගත කිරීම් ප්‍රතිශතය සියයට 13 ක් තරම් පහළ අගයක් ගෙන තිබුණි. පසුගිය වර්ෂ 5ක කාලය තුළද රැකියා අපේක්ෂිතයින් රැකියා ගත කිරීම් ප්‍රතිශතය අවම මට්ටමක පැවති අතර එය වර්ධනය කර ගැනීමට අවශ්‍ය කාලීන පියවර, වගකිව යුතු නිලධාරීන් විසින් ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ නිශ්චිත අරමුණු හා කාර්යභාරයන් ඉෂ්ඨ කර ගැනීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කල යුතුය. | අපගේ රැකියා සේවාවන් ලබා ගන්නා ආයතන, පුරප්පාඩු සපුරා ගත්තේද යන්න පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව සිදු නොකිරීම මෙයට හේතු වී ඇත. මෙම ප්‍රතිචාර දැක්වීම නිසි පරිදි සිදුකරවා ගැනීමට අවශ්‍ය පෙලඹවීම මේ වන විට සිදුකරමින් පවතී. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී රු.344,470 ක් වැයකර වෘත්තීය මාර්ගෝපදේශනය අවශ්‍ය වන වෘත්තිකයන් හා විවිධ පාර්ශවකරුවන්ගේ වෘත්තීය | සඟරා මුද්‍රණය කිරීමේ අරමුණ ඉටුවන පරිදි ඒවා අවශ්‍ය පුද්ගලයන් අතට පත්වන පරිදි බෙදාහැරීමට දෙපාර්තමේන්තුව කටයුතු | විගණන කටයුතු සිදුවන විට "හසර" සඟරා බෙදාහැර නොතිබුණු අතර මේ වන විට එක් සඟරා කලාපයකින් පිටපත් 200 බැගින් සඟරා 800 ක් ප්‍රධාන |

| | | |
|---|---|---|
| වරණය හා වෘත්තීය සංවර්ධනය ආශ්‍රිතව මාර්ගෝපදේශන සේවාවන් ලබාදීමේ අරමුණින් මුද්‍රණය කරන ලද කලාප 4 කට අයත් ''හසර'' සඟරා 7,746 ක් බෙදාහැර නොතිබුණි. | කල යුතුය. | කාර්යාලයේ රඳවා ගෙන ඉතිරිය බෙදාහැර ඇත. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රැකියා නිර්මාණ ප්‍රවර්ධනය හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය විසින් දිස්ත්‍රික්ක 25 සඳහා 2019 අගෝස්තු 31 දින වන විට වැඩ සටහන් 362 ක් පවත්වා තිබූ අතර මේ සඳහා සහභාගීවූ ප්‍රතිලාභීන් 12,774 ක් අතරින් ස්වයං රැකියා ආරම්භ කල සංඛ්‍යාව 911 ක් පමණක් විය. ඒ අනුව ස්වයං රැකියා සඳහා යොමු වූ ප්‍රතිශතය සියයට 7 ක් පමණක් වීමෙන් ස්වයං රැකියා වැඩසටහන් සඳහා සහභාගී වූවන්ගෙන් රැකියා සඳහා යොමු වූවන් ඉතාම අවම සංඛ්‍යාවක් බව නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයන්හිදී මෙම තත්වය මෙයට සමාන වී තිබුණි. මේ සඳහා හේතු විමසා බලා කාර්යසාධනය වැඩිකර ගැනීම සඳහා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභය මහජනතාවට ලැබෙන බව තහවුරු වන කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් තුලින් සිය සේවාවන් මහජනතාවට ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | මෙම වැඩසටහන් මගින් ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම හා ස්වයං රැකියාවක් ඇරඹීම සඳහා පෙළඹවීම සිදුවේ. එක් දින හා තෙදින වැඩමුළු මගින් ස්වයං රැකියාලාභීන් බිහිකිරීම ප්‍රායෝගිකව ගත්කල ළඟාකර ගැනීමට අසීරු ඉලක්කයක් බව පැහැදිලිය. එබැවින් මෙම වැඩසටහන්වලින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ කෙසේද, පවත්නා ව්‍යාපාරය සාර්ථකව ඉදිරියට ගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රතිලාභීන් හට දැනුම ලබාදීම මූලිකවම සිදුකරයි. |
| (ආ) දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන මගින් රැකියා අපේක්ෂිතයින් සඳහා පුහුණු පහසුකම් සැපයීම් සිදුකරනු ලබයි. රැකියා අවස්ථාවන් සඳහා රැකියා | දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභය මහජනතාවට ලැබෙන බව තහවුරු වන කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් තුලින් සිය | රැකියා අවස්ථාවන් ගැලපීම් වුවත් රැකියා අපේක්ෂකයින් ඇතැම් රැකියා සඳහා යෑමට අකමැත්තක් දැක්වීම හා වෙනත් හේතුන්ද මෙම තත්ත්වයට හේතු වී ඇත. ඔවුන් පුහුණුවීම් සඳහා සහභාගී වීමට |

| | | |
|---|---|---|
| අපේක්ෂකයින්ගේ සුදුසුකම් ගැලපුනද එම පුද්ගලයින්ව රැකියාව සඳහා තෝරා ගැනීම අවම මට්ටමක පැවතුණු බවත් ඒ සඳහා හේතු ලෙස රැකියාස්ථ පුහුණුව නොමැතිවීම බවත් නිරීක්ෂණය විය.<br>එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් 25,864 කින් රැකියා පුහුණු කිරීම් සඳහා යොමු කල පිරිස 921 ක් තරම් අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. තවද, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගම්පහ, හම්බන්තොට, යාපනය, කෑගල්ල, කිලිනොච්චිය, මාතර, නුවරඑළිය, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල කිසිදු අපේක්ෂකයෙකු රැකියා පුහුණුව සඳහා යොමුකර නොතිබුණි. | සේවාවන් මහජනතාවට ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතුය. | මැලිකමක් දැක්වීමද මෙයට හේතු වී ඇත. රැකියා අපේක්ෂකයින්ගේ නිපුණතාවන් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කීපයක්ම එකට කටයුතු කරන අතර 2020 වර්ෂය තුලදී එම ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකට එළඹීමට තීරණය කර ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට තනතුරු 16 කට අදාලව දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 119 ක් පැවතිණි. ඒ අතර වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුරු 53 ක්ද, මානව සම්පත් සංවර්ධන නිලධාරී තනතුරු 49 ක් ද විය. දැනට සිටින බොහෝ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් වයස අවුරුදු 50 ඉක්මවූවන් වීමත් සේවා ව්‍යවස්ථාමය ගැටලු මතත් වර්ෂ 2000 න් පසු එම තනතුරු සඳහා නැවත | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත දෙපාර්තමේන්තුව සතුව පවතින බවට ගණන්දීමේ නිලධාරියා නිරන්තරයෙන් පරීක්ෂාවට බඳුන්කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු කඩිනමින් පිරවීමට ගතහැකි සෑම පියවරක්ම ගත යුතුය. | මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු හා ඒකාබද්ධ සේවයට අයත් තනතුරු සම්පූර්ණ කිරීම සඳහා එම තනතුරුවලට බඳවා ගැනීමට දෙපාර්තමේන්තුවක් ලෙස එහි දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය නොමැති බව අවධාරණය කරමි. එබැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස අදාල ආයතන වෙත දැන්වීම හැර වෙනත් විකල්පයක් අප සතුව නොමැති බව කාරුණිකව පෙන්වා දෙමි. මේ සම්බන්ධව රාජ්‍ය පරිපාලන ලේකම් හා සාකච්ඡා කිරීමද අප විසින් සිදුකර ඇති අතර පුරප්පාඩු පිළිබඳව කිහිප වතාවක්ම අදාල අංශ දැනුවත් කොට ඇත.<br>දෙපාර්තමේන්තුගත තනතුරක්ව පැවති ක්ෂේත්‍ර |

බඳවා ගැනීමට නොහැකි තත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

නිලධාරී තනතුරක් වන වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී තනතුර වැඩසටහන් නිලධාරී සේවා ව්‍යවස්ථාව යටතේ සංවර්ධන නිලධාරී අන්තර්ග්‍රහණය වන තනතුරකි. නමුත් එම තනතුරට අයත් නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයට අකමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් එම නිලධාරීන් 32 ට පමණක් පෞද්ගලික වනසේ එම තනතුර දෙපාර්තමේන්තු ගත තනතුරක් ලෙස පවතී.